**ගරු නිවාස අමාත්‍යතුමාගේ පණිවුඩය**



සංවර්ධන ක්‍රියාදාමයක් වඩාත් ඵලදායිවීමට නම් එම සංවර්ධන ක්‍රියාවලියේ සැලසුම්කරුවන් සහ ප්‍රතිලාභින් එක ලෙසින් එකී කාර්ය සඳහා දායකවිය යුතුවේ. විශේෂයෙන් ජනාවාස සංවර්ධන ක්‍රියාදාමයේදී වඩාත් ඵලදායි ප්‍රතිඵල ලැබීම සඳහා එවන් ක්‍රියාකාරිත්වයක් තිබීම අත්‍යාවශ්‍ය වේ .

2008 වසරේ ඔක්තෝබර් මස 06 දිනට යෙදෙන ලෝක ජනාවාස දින නිමිත්තෙන් මෙවර ජනාවාස දින තේමාව වන **“සහජීවන නගර”** යන්න මුල්කොට ක්‍රියාවට නැංවෙන ජනාවාස සංවර්ධන ක්‍රියාවලිය මෙවන්වු අදහසක් පෙරදැරිකොට ක්‍රියාත්මක වේ .

අතීතයේ පාරම්පරික කර්මාන්තයනට හිමිකම් කී පසුකලක ශ්‍රී ලංකාවේ ප්‍රමුඛතම කර්මාන්ත පුරවරයක් වු මොරටුව නගරය මෙවර ජනාවාස දින වැඩසටහන් ක්‍රියාවලියේ කේන්ද්‍රස්ථානයයි . මොරටුව නගරයේ ජනාත සංවර්ධනය මුල්කොට දිවයින පුරා සියළු දිස්ත්‍රික්ක ආවරණය වන අයුරින් ඒකාබද්ධ ජනාවාස සංවර්ධන ක්‍රියාදාමයක් ක්‍රියාත්මකවීම මෙමර ජනාවාස දින සංවර්ධන වැඩපිලිවෙලහි ඇති විශේෂත්වයයි . එහි සැබෑ නියමුවන් වන නිවාස හා පොදු පහසුකම් අමාත්‍යාංශය සහ නාගරික සංවර්ධන හා පූජාභූමි සංවර්ධන අමාත්‍යාංශය මේ සියලු සංවර්ධන කටයුතු තම අමාත්‍යාංශයන්ට අනුබද්ධිත ආයතන හා මොරටුව මහනගර සභාව සමගින් ඒකාබද්ධව ක්‍රියාවට නැංවීම තුළින් මෙම වැඩපිලිවෙල වඩාත් අර්ථාන්විත වී තිබේ .

මෙම ජනාවාස දින ක්‍රියාදාමය හුදෙක් එක් දිනකට පමණක් සීමානොකොට පුර සතියකට වැඩි කාලයක් පුරා ක්‍රියාත්මක කරමින් එකී සංවර්ධන කාර්යයේ ප්‍රතිලාභ ජනතාවට හිමිකරදෙනු පිණිස මැති ඇමතිවරුන් ඇතුළු අමාත්‍යාංශ ධෛර්යවන්ත කරමින් මග පෙන්වු අතිගරු ජනාධිපතිතුමා ගෞරවයෙන් සිහිපත් කරන අතර මෙම වැඩපිලිවෙල සාර්ථක කරගැනීමට සහභාගීත්වයෙන් දායකවුනු ප්‍රාදේශිය මහජන නියෝජිතයින් ඇතුළු සියළු නිලධාරින්ටත් මේ අවස්ථාවේදී ස්තූතිවන්ත වෙමි .

අතිගරු ජනාධිපතිතුමාගේ මහින්ද චින්තන වැඩසටහනේ සඳහන් ශ්‍රී ලංකාවේ සෑම පවුලකටම නිවසක් හිමිවිය යුතුයි යන උතුම් අරමුණ සාක්ෂාත් කරගැනීමට කැපවන ලෙස මෙවර ලෝක ජනාවාස දිනයට එක්වන සියළු දෙනාට ආරාධනා කරමි .

**ගීතාංජන ගුණවර්ධන**
**නිවාස අමාත්‍ය**